සිංහල භාෂාව හා සාහිත්‍යය

ශ්‍රී ලංකාවේ පැරණි නිවාස

ශ්‍රේණිය -: 10

වාරය -: තුන්වන වාරය

නිපුණතා මට්ටම් -: 10.2 දැනුම ලබාගැනීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොත පත කියව යි.

-: 6.3 අවසාන පද නිවැරදි ව භාවිත කරයි.

ක්‍රියාකාරකම් - 01

- පාඩම කියවා පිළිතුරු ලියන්න.

1) ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසුන්ගේ ජීවනෝපාය වූයේ කුමක් ද?

.....

2) ශිෂ්ටාචාරික ලක්ෂණයක් ලෙස පාඩමෙහි දක්වා ඇත්තේ කුමක් ද?

.....

3) "ස්ථිරවාසිතාව" යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

.....

4) වැළලී ගිය ඓතිහාසික තොරතුරු සොයා ගැනීමට අනුගමනය කරනු ලබන ක්‍රමවේදයක් ලියන්න.

.....

5) ප්‍රාග් ඓතිහාසික යුගය යනුවෙන් හඳුන්වන්නේ කවර කාලය ද?

.....

ක්‍රියාකාරකම - 02

1) පාඩම කියවා පැරණි නිවාස පිළිබඳ තොරතුරු අදාළ හිස්තැනෙහි යොදන්න.

ගම	ගෙබිමේ ස්වභාවය	සොයාගත් වර්ෂය	දිස්ත්‍රික්කය
I. හල්දුම්මුල්ල			
II. උඩරංවාමඩම			
III. කිරින්දගොඩාන			

2) නිවාස තනා ගැනීමේ දී යොදා ගත් ද්‍රව්‍ය මොනවා ද?
   I. ගෙබිම :.....
   II. වහල : .....
   III. බිත්ති : .....
3) උඩරංචාමඩම නිවාසයේ ඉදිරිපස කොටසේ තිබී සොයා ගන්නා ලද පුරා වස්තු කිහිපයක් ලියන්න.
   .....
   .....
4) එම අවශේෂවල ස්වරූපයෙන් එම නිවසේ ඉදිරිපස කොටසේ කවුරුන් විසූ බව පෙනේ ද?
   .....
5) නිවසෙහි පිටුපස කොටසෙන් හමුවූ ද්‍රව්‍ය සඳහන් කරන්න.
   .....
   .....

ක්‍රියාකාරකම් 3

1) පාඩමෙහි ඇතුළත් පහත දැක්වෙන පද විසන්ධි කර ලියන්න.
   I. දඩයම් :.....
   II. ජීවනෝපාය :.....
   III. මෑත :.....
   IV. වෘත්තාකාර :.....
   V. චතුරස්‍රාකාර : .....

ක්‍රියාකාරකම - 04

- "A" තීරුවේ අදහසට ගැළපෙන තනි වචනය "B" තීරුවෙන් තෝරා යා කරන්න.

A		B	
I.	ජීවත් වීමට ගන්නා උපාය මාර්ග	i.	අර්ධද්වීපය
II.	වාසය කිරීම සඳහා තනා ගත් ස්ථාන	ii.	වෘත්තාකාර
III.	පුරාණ වස්තු පිළිබඳ හදාරන විද්‍යාව	iii.	ජීවනෝපාය
IV.	වෘත්තයක කේන්ද්‍රය මැදින් පරිධිය යා කෙරෙන දුර	iv.	ස්ථිරවාසීතාව
V.	නිවසක ආහාර පිසින කොටස	v.	පුරාවිද්‍යා
VI.	එක් පැත්තක් හැර ජලයෙන් වට වූ ගොඩබිම	vi.	විෂ්කම්භය
VII.	වටකුරු හැඩයෙන් යුත්	vii.	මුළුතැන්ගෙය
VIII.	දීර්ඝ කාලයක් එක ස්ථානයක ජීවත් වීමේ පුරුද්ද	**viii.**	වාසස්ථාන

ක්‍රියාකාරකම - 05

පහත දැක්වෙන වචන නිපාත සහ උපසර්ග වශයෙන් බෙදා වෙන් කර දක්වන්න.

සඳහා	අවලස්සන	සුසිරිත්
පරාජය	නිසැක	අනුනායක
පිණිස	ඉක්බිති	අභිධර්මය
සුපිරිසිදු	අද	මෙන්
වනාහී	හෙවත්	එම්බල

ක්‍රියාකාරකම - 06

පහත දැක්වෙන එක් එක් වාක්‍යයේ ඇතුළත් නිපාත පද තෝරා ලියන්න.

1) එම්බා මිනිසුනි, සැමට මෛත්‍රී කරන්න.
   .....
2) ඔවුහු නිතර අපට හමුවෙති.
   .....
3) අනේ මට අනුකම්පා කරන්න.
   .....
4) අපි මුහුදු වෙරළ දක්වා ගමන් කළෙමු.
   .....
5) බළලුන් විසින් මීයෝ ඇල්ලෙති.
   .....
6) මිනිසා හඳට ගියා ලු .
   .....
7) ඔහු ද මම ද ක්‍රීඩා කරමු.
   .....
8) ළමයා හඬන්නේ ඇයි?
   .....
9) බසය එනතුරු අපි බලා සිටියෙමු.
   .....
10) අම්මා ගෙදර බුදුන් ලෙස සැලකේ.
   .....

ක්‍රියාකාරකම - 07

1.පහත දී ඇති වචනය ඉදිරියෙන් උපසර්ග යොදා විරුද්ධාර්ථ පද සාදන්න.

I.	වාසි	IV.	රැකියා	VII.	සාධ්‍ය	X.	වාසි	XIII.	මිතුරු
II.	සිරිත්	V.	වල	VIII.	ජය	XI.	ප්‍රයෝජන	XIV.	බල
III.	දුක්	VI.	අවුල්	IX.	සරු	XII.	දක්ෂ	XV.	පක්ෂ

2. පහත දී ඇති වචන ඉදිරියෙන් අර්ථය වැඩි කිරීම සඳහා උපසර්ග යොදා පද සාදන්න.

I.	මිහිරි	IX.	දක්ෂ
II.	වර	X.	වර්ධන
III.	බල	XI.	පැරණි
IV.	මහත්	XII.	විශාල
V.	ගරු	XIII.	පුන්
VI.	පිරිසිදු	XIV.	ධර්මය
VII.	පිරි	XV.	පෝෂිත
VIII.	විනීත		